# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1317 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 19/10/2023 පැය 0600

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට- කිලිනොච්චිය පොලිස් ස්ථානය.

2023.09.25 වන දින සවස් කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ ඌට්ටුකුලම් ප්‍රදේශයේදී පහරදී පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිද්ධියක් සම්බන්ධව කිලිනොච්චිය පොලීසිය විසින් විමර්ශන ආරම්භ කර තිබූ අතර ඒ අනුව එම මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් අවශ්‍යව සිටි සැකකරුවෙකු මුලතිව් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මුලතිව් ප්‍රදේශයේදී 2023.10.18 වන දින අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**සැකකරු වයස අවුරුදු 22 ක් වන ශිවනගර්, උරුත්තිපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙපිරිසක් අතර ඇති වූ ගැටුමක් හේතුවෙන් මෙම ඝාතනය සිදුව ඇති අතර ඊට අදාලව සැකකරුවන් දෙදෙනෙකු මීට පෙර අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. අවි පෙන්වා දේපල කොල්ලකෑමක් - මාදම්පේ පොලිස් වසම.

2023.10.18 වන දින සවස් කාලයේ මාදම්පේ පොලිස් වසමේ තඹගල්ල, කාකපල්ලිය ප්‍රදේශයේ නිවසකට ඇතුළු වූ මුඛ ආවරණ පැළඳ සිටි සිව්දෙනෙකුගෙන් සමන්විත කොල්ලකරුවන් පිරිසක් පිස්තෝලයක් වැනි ගිනි අවියක් සහ කඩුවක් පෙන්වා නිවැසියන් බියගන්වා රුපියල් 9 30,000/= ක මුදලක් හා පවුම් 29 ක් පමණ බර රන් ආභරණ හා ජංගම දුරකථයක් කොල්ලකෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් මාදම්පේ පොලිසිය වෙත ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

කොල්ලකෑමට ලක්වූ නිවසේ හිමිකරු ව්‍යාපාරිකයකු වන අතර ඔහු සිද්ධිය වන අවස්ථාවේ නිවසේ සිට නොමැති අතර ව්‍යාපාරිකයාගේ බිරිඳ, පුතා සහ විවාහ වී

සිටින දියණිය ද සිද්ධිය වන අවස්ථාවේ නිවසෙහි සිට ඇත. කොල්ලකරුවන් සුදු පැහැති වෑන් රථයකින් පැමිණ ඇති අතර ව්‍යාපාරිකයා නිවසේ සිටින්නේ ද යන්න විමසමින් නිවසට ඇතුළු වී ඇති බවත්, ඉන්පසු නිවැසියන් නිවස තුළට බලහත්කාරයෙන් රැගෙන ගොස් දෑත් ගැටගසා ඔවුන් සතු රන්භාණ්ඩ හා මුදල් ඇතුළු දේපල කොල්ලකා පලාගොස් ඇත.

මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මාදම්පේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. ගෙවල් බිඳුමකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - කිලිනොච්චිය පොලිස් ස්ථානය.

2023.08.26 වන දින කිලිනොච්චිය පොලිස් ස්ථානය වෙත වාර්තා වී තිබූ නිවසක් බිඳ රුපියල් එක් ලක්ෂ තිස් පන්දහසකට අධික වටිනාකමින් යුත් දේපල හා රන්භාණ්ඩ සොරකම් කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් කිලිනොච්චිය පොලිස් ස්ථානය විසින් විමර්ශන ආරම්භ කර තිබුණි. ඒ අනුව ලද තොරතුරකට අනුව අපරාධයට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු 2023.10.18 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන පොන්නගර් උතුර, කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධය සම්බන්ධයෙන් කිලිනොච්චිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. ගෙවල් බිඳුමකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මන්නාරම පොලිස් ස්ථානය.

2023.10.12 වන දින මන්නාරම පොලිස් ස්ථානය වෙත වාර්තා වී තිබූ නිවසක් බිඳ රුපියල් ලක්ෂ 28 05,000/= වටිනාකමින් යුත් රන්භාණ්ඩ හා මුදල් සොරකම් කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් මන්නාරම පොලිස් ස්ථානය විසින් විමර්ශන ආරම්භ කර අපරාධය සම්බන්ධයෙන් අවශ්‍ය කර සිටි සැකකරුවෙකු 2023.10.18 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 17 ක් වන ජෝසප් වාස් නගර්, තෝට්ටවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධය සම්බන්ධයෙන් මන්නාරම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත බඳින තුවක්කු කඳන් 06 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇහැලියගොඩ පොලිස් ස්ථානය

2023.10.18 වන දින දහවල් කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ එලවුල්ල, පරකඩුව ප්‍රදේශයේදී ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත බඳින තුවක්කකු කඳන් 06 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ ඉහළ එලවුල්ල, පරකඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිද්ධිය සම්බන්ධයෙන් ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත බඳින තුවක්කු කඳක් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොල්පිතිගම පොලිස් ස්ථානය**

2023.10.18 වන දින දහවල් කාලයේ පොල්පිතිගම පොලිස් වසමේ කිරිබමුණේගම ප්‍රදේශයේදී පොල්පිතිගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත බඳින තුවක්කකු කඳක් සහ නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 180 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ ඉහළ කිරිබමුණේගම, පොල්පිතිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිද්ධිය සම්බන්ධයෙන් පොල්පිතිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**07. නාඳුනන මළ සිරුරක් - පුත්තලම පොලිස් වසම.**

2023.10.18 වන දින පුත්තලම පොලිස් වසමේ පුත්තලම කලපු තීර උද්‍යානයේ නාඳුනන පුද්ගල මළ සිරුරක් ඇති බවට පුත්තලම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 55 - 60 පමණ වන අතර අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මරණකරු උස අඩි 05 අඟල් 03 ක් පමණ, තළෙළු සිහින් සිරුර, හිසේ ඉදිරිපසින් තට්ටය පෑදී ඇත. කොටු සහිත ලා පැහැති කමිසයක් හා කළු පැහැති දිග කලිසමක් හැඳ, දුඹුරු පැහැති පාවහන් පැළඳ ඇත. මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**08. මාරක රිය අනතුරක් - කුලියාපිටිය පොලිස් වසම.**

2023.10.18 වන දින සවස් කාලයේ කුලියාපිටිය පොලිස් වසමේ කුලියාපිටිය හෙට්ටිපොල මාර්ගයේ 01 වන කිලෝමීටර් කණුව ආසන්නයේදී හෙට්ටිපොල දෙස සිට කුලියාපිටිය දෙසට ධාවනය වූ කැබ් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 15 ක් වූ තෝරකොටුව, ගොන්නව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය පුද්ගලයාගේ මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - ගම්පොල පොලිස් වසම.

2023.10.18 වන දින රාත්‍රී කාලයේ ගම්පොල පොලිස් වසමේ ගම්පොල දොළුව මාර්ගයේ ගුරුකැලේ ප්‍රදේශයේදී දොළුව හන්දිය දෙස සිට ගම්පොල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන දුරකථන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු සහ පසුපස අසුනේ ගමන් කල පුද්ගලයෙකු ගම්පොල රෝහලට ඇතුළත් කිරීමෙන් පසු පසුපස අසුනේ ගමන් කල පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ ගුරුකැලේ නිල්ලඹ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීර ගම්පොල රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. ගම්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**